# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1343/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/08/2024 පැය 1700

**මාධ්‍ය නිවේදනය**

**මාරක රිය අනතුරක් - කඳාන පොලිස් වසම.**

2024.08.19 වන අද දින දහවල් කාලයේ කඳාන පොලිස් වසමේ වැලිගම්පිටිය හන්දියේදී යතුරු පැදියකින් පැමිණි පුද්ගලයන් තිදෙනෙකු ටිපර් රථයක ගැටී සිදුවූ රිය අනතුරකින් එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වන වැලිගම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට පත් යතුරු පැදියේ පැදිකරු හා පසු පැදිකරුවන් දෙදෙනා හිස් වැසුම් රහිතව වැලිගම්පිටිය දෙස සිට කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගය දෙසට ගමන් කරමින් සිටියදී වැලිගම්පිටිය හන්දිය ආසන්නයේදී පොලිස් නිලධාරීන් විසින් යතුරු පැදිය නවතන ලෙසට සංඥා කර ඇත. එහිදී පැදිකරු පොලිස් අණ නොතකා ප්‍රධාන මාර්ගය දෙසට නොනවත්වා ධාවනය කර ඇති අතර, පිටුපස අංක තහඩුව නොමැතිව ගමන්ගත් මෙම යතුරු පැදිය මීගමුව කොළඹ ප්‍රධාන මාර්ගයට පිවිසීමේදී මීගමුව දෙස සිට පැමිණි ටිපර් රථයක ගැටී මෙම අනතුර සිදුව ඇත.

අනතුරින් පසු යතුරු පැදියේ සිටි අනෙත් දෙදෙනා එම ස්ථානයෙන් පලා ගොස් ඇත. කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**